**ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය - 2019**

**-------------------------------------------------------**

**1.1 මතය**

**-------**

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

**---------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී .ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී.

මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසය යි.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට දී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තව ද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේ දී හා තක්සේරු කිරීමේ දී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදු වන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදු කරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකි ය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේ ද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාලවකවානුවල දී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 අධිකාරී බලය නොලත් ගණුදෙනු

| අධිකාරී බලය නොලත් ගනුදෙනු | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නිලධාරියෙකු විසින් 2010 වර්ෂයේ දී එවකට පරමාණුක ශක්ති අධිකාරියට එරෙහිව නඩුවක් පවරා තිබුණි. වග උත්තරකරුවන් සියළු දෙනාගේම එකඟත්වය සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව පරමාණුක බලශක්ති මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය මත, 2016 නොවැම්බර් 29 දින පැමිණිලිකාර පාර්ශ්වය 2006 වර්ෂයේ සිට MM වැටුප් කේතයේ වැටුප් පරිමාණයට පත් කිරීමට තීරණය කර තිබුණි. මෙම තීරණය සැලකිල්ලට ගෙන පැමිණිලිකරු විසින් ඒකපාර්ශ්විකව මෙම නඩුව ඉල්ලා අස්කරගෙන ඇත. ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් රජයේ අයිතිවාසිකම්වලට හානිදායක වන ආකාරයෙන් කටයුතු කර තිබුණි. 2019 වර්ෂය තුළදී ඉහත සඳහන් නිලධාරියා හට හිඟ වැටුප් ලෙස රු. 2,961,304 ක් තවදුරටත් ගෙවා තිබුණි. | ඉදිරියේ දී මේ සම්බන්ධව නිර්දේශ ලබා දීමේ දී වඩාත් සැලකිලිමත්ව කටයුතු කරන බව දැනුම් දෙමි. | නිසි අධිකාරී බලයකින් තොරව තීරණ ගැනීම සිදු නොකළ යුතු අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් රජයේ අයිතිවාසිකම්වලට හානිදායක වන ආකාරයෙන් ගත් තීරණ අනුව දැනට කටයුතු කිරීම නිවැරදි කිරීමට ගණන්දීමේ නිලධාරියා මුදල් රෙගුලාසි 128 (1) (ජ) ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට පැවති නොපිය වූ දේශීය මිලට ගැනුම් අත්තිකාරම් ශේෂය වන රු. 1,614,672 න් රු. 1,116,663 ක් 2020 ජුනි 30 දින වන විටත් පියවා නොතිබුණි. | නොපිය වූ අත්තිකාරම් අතරින් ආගන් සහ ලිපි ද්‍රව්‍ය මිල දී ගැනීම වෙනුවෙන් ලබා දුන් අත්තිකරම් හැර අනෙකුත් අත්තිකාරම් මේ වන විට පියවා ඇත. | අත්තිකාරම් නිශ්චිත කාලය තුල පියවා ගැනීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් පරිදි කටයුතු කළ යුතුය. |

## 1.7 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2016 මාර්තු 31 දිනැති අංක 2016/05 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2020 මාර්තු 17 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එසේ ඉදිරිපත් කර නොතිබුණි. | 2019 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය අවසන් කර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගත් විගස විගණනයට ඉදිරිපත් කරනු ලැබේ. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) 1994 අප්‍රේල් 20 දිනැති අංක 30/94 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය | විදේශ ආධාර සම්බන්ධ සියළු ගනුදෙනු මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජනරාල් විසින් කල යුතු වුවත් ඊට අනුගත නොවී මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය තුල එකතුව රු. 16,474,125 ක් වූ විදේශ ප්‍රදාන ලැබීම් 12 ක් භාණ්ඩාගාරය හරහා ලබා නොගෙන ඍජුවම ආයතනය වෙත ලබා ගෙන තිබුණි. | මෙම ආධාර පෙර වර්ෂයන්හි ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති සඳහා ලැබී ඇත. 2020 වර්ෂයේ සිට නිවැරදි ක්‍රියාමාර්ග අනුගමනය කරමින් ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | අදාළ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව විදේශ ප්‍රදාන ලැබීම් සම්බන්ධව කටයුතු කළ යුතුය. |
| (ඇ) 2010 දෙසැම්බර් 10 දිනැති අංක 01/2010 දරන වෙළඳ, තීරු බදු හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛය | චක්‍රලේඛ නියමයන්ට පටහැනිව මණ්ඩලයේ නිලධාරීන් තුන්දෙනෙක් සහනදායී මොටර් රථ බලපත්‍ර හිමිකම ලැබීමට නියමිත දිනට ආසන්න වශයෙන් වසර 05 ත් 08 ත් අතර කාලයකට පෙර | නියමිත කාලය සම්පූර්ණ වීමට පෙර සහනදායී පදනම මත මෝටර් රථ බලපත්‍ර ලබා ගත් නිලධාරීන් සියළු දෙනාගේ පෞද්ගලික ලිපි ගොනු | අදාළ වෙළඳ, තීරු බදු හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පළමු බලපත්‍රය ලබා ගෙන තිබුණු අතර දෙවන බලපත්‍රය ද වසර 02 ත් 04 ත් කාලයකට පෙර ලබා ගෙන තිබුණි. මීට අමතරව තවත් නිලධාරින් 05 දෙනෙක් ආසන්න වශයෙන් වසර 01 ත් 06 ත් අතර කාලයකට පෙර පළමු බලපත්‍රය ලබා ගෙන තිබුණි. | වෙත ලිපි නිකුත් කළ අතර ඉදිරියේ දී මේ පිළිබඳව නිර්දේශ ලබා දීමේ දී වඩාත් සැලකිලිමත්ව කටයුතු කරන බව දැනුම් දෙමි. | |
| (ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| (1) 8.5 ඡේදය | ආයතනයක ඇති වත්කම් ආරක්ෂාව සම්බන්ධව රක්ෂණ ක්‍රමවේදයක් තිබිය යුතු වුවත් මණ්ඩලය සතු රු. 1,446,880,651 ක දේපල, පිරියත හා උපකරණ සඳහා එවැනි ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. | ගැමා මධ්‍යස්ථානයේ දැනටමත් වත්කම් රක්ෂණය සිදු කර ඇති අතර නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානය හා ප්‍රධාන කාර්යාලයේ වත්කම් ද රක්ෂණය කිරීමට අවශ්‍ය ලේඛන සකස් කරමින් පවතී. | අදාළ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (11) 6.5.1 ඡේදය | ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන දින 106 ක් ප්‍රමාද වී ඉදිරිපත් කර තිබුණි. | කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් 2020 මාර්තු 13 දින පැවැත්වීමට නියමිතව තිබූ අධ්‍යක්ෂ මණ්ඩල රුස්වීම නොපැවති අතර කාර්යාලය සාමාන්‍ය පරිදි විවෘත කර පැවැත්වූ පළමු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී මූල්‍ය ප්‍රකාශන සඳහා අනුමැතිය ලබා ගෙන විගණනයට ඉදිරිපත් කරන ලදි. | අදාල රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව නියමිත දිනට පෙර මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |
| (111) 5 ඡේදය | 2019 මුදල් වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර 2019, 2020 හා 2021 වර්ෂවලට අදාළව යාවත්කාලීන කරන ලද සංයුක්ත සැලැස්ම කළමනාකරණ මණ්ඩලය | 2018-2020 යන වර්ෂ සඳහා සංයුක්ත සැලැස්ම පිළියෙල කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇති අතර 2021-2023 යන වර්ෂ සඳහා | අදාල රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව යාවත්කාලීන කරන ලද සංයුක්ත සැලැස්ම කළමනාකරණ |

| | | | |
|---|---|---|---|
| | අනුමත කර එහි පිටපතක් විගණකාධිපතිට ඉදිරිපත් කළ යුතු වුවත් එසේ කර නොතිබුණි. | සංයුක්ත සැලැස්ම මේ වන විට සකස් කරමින් පවතී. | මණ්ඩලය අනුමත කර එහි පිටපතක් විගණකාධිපතිට ඉදිරිපත් කළ යුතුය. |
| (ඉ) 2017 ඔක්තෝබර් 25 දිනැති අංක 05/2017 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛය | පසුගිය විගණන වාර්තාවලින් ද පෙන්වා දී තිබිය දී හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම් වෙත දන්වා තිබුණ පරිදි IV ශ්‍රේණියට අයත් සේවා කාලය වෘත්තීය දීමනා ගෙවීම සඳහා අදාළ කර ගත නොහැකි බව දන්වා තිබිය දී 2019 වර්ෂයේ දී නිලධාරින් නවදෙනෙකුට වෘත්තීය දීමනා ලෙස රු. 370,000 ක් ගෙවා තිබුණි. | වෘත්තීය දීමනාව ගෙවීමේ දී අදාළ සේවා කාලය ගණනය කිරීමට සලකා බලනු ලබන සේවා ගණ සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම් මගින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් පැහැදිලි කරවා ගැනීමට 2020 පෙබරවාරි 20 දිනැතිව ලිපියක් ඉදිරිපත් කොට ඇත. එම පැහැදිලි කිරීම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ලැබුණු පසුව ඉදිරි කටයුතු සිදු කරන බව කාරුණිකව දැනුම් දෙමි. | අදාළ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 27,974,911 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 413,699 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 28,388,610 ක වර්ධනයක් නිරීක්ෂණය විය. භාණ්ඩාගාරයෙන් ලැබුණු පුනරාවර්තන ප්‍රදාන රු. 11,630,000 කින් ද, ආහාර සාම්පල් පරීක්ෂාව මගින් ලද ආදායම රු. 17,253,963 කින් ද, නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානයේ සෝදිසි පරීක්ෂා ආදායම රු. 16,289,189 කින් ද, ඉහළ යාම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 03 ක මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී 2016 වර්ෂයේ දී රු. 3,864,974 ක් වූ ශුද්ධ ලාභය, 2017 වර්ෂය වන විට රු. 1,456,454 ක ශුද්ධ ලාභයක් දක්වා ද 2018 වර්ෂය වන විට රු. 413,699 ක ශුද්ධ අලාභයක් දක්වා ද පිරිහී තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂයේ දී එය රු. 27,974,911 ක ශුද්ධ ලාභයක් දක්වා වර්ධනය වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමිකය නැවත ගැලපීමෙන් පසු 2016 වර්ෂයේ දී රු. 100,011,637 ක් වූ මණ්ඩලයේ දායකත්වය 2019 වර්ෂය අවසානයට රු. 159,872,865 ක් දක්වා ක්‍රමයෙන් වර්ධනය වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| නාගරික සංවර්ධන අධිකාරියෙන් 99 අවුරුද්දකට බදු ලබා ගත් ශ්‍රී ලංකා පරමාණුක ශක්ති අධිකාරියේ පැරණි ප්‍රධාන කාර්යාලය පිහිටි ඔරුගොඩවත්ත ඉඩම, කැලණි පාලම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය වූ බැවින් මණ්ඩලය ප්‍රතිස්ථාපනය කිරීම සඳහා මාලඹේ ප්‍රදේශයෙන් විකල්ප ඉඩමක් රු. මිලියන 181 කට නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් මිල දී ගෙන තිබුණි .එම ඉඩම තුල පරමාණුක බලශක්ති මණ්ඩලයේ පැරණි ගොඩනැගිල්ලට සමාන ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 2015 මාර්තු මාසයේ ආරම්භ කරන ලද ඉදිකිරීම් 2015 ජූනි මාසයේ සිට සම්පූර්ණයෙන් නවතා තිබුණි. තත්ත්වය මෙසේ තිබිය දී ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් නාගරික සංවර්ධන අධිකාරියෙන් 30 අවුරුද්දකට බදු ලබා ගත් ඉඩමක් උක්ත කාර්යය සඳහා යොදා ගැනීමට පරමාණුක බලශක්ති මණ්ඩලය, නාගරික සංවර්ධන අධිකාරිය හා ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය අතර ත්‍රෛපාර්ශවික අවබෝධතා ගිවිසුමක් අත්සන් කර ඇත. එම ගිවිසුමට අනුව ඉහත ඉඩම මණ්ඩලයට ලබා දී මාලඹේ පිහිටි ඉඩම ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ භාවිතය සඳහා ලබා දීමටත් ඉඩම් නිරවුල් කිරීමේ දී වටිනාකම්වල වෙනස අදාල පාර්ශවයන් විසින් පියවීමටත් එකඟ වී ඇත. නමුත් 2019 වර්ෂය අවසන් වන විටත් මෙම ඉඩම් නිරවුල් කර ගැනීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් ප්‍රගතියක් පෙන්වා නොතිබුණි. | නව ගොඩනැගිල්ල අයත් ඉඩම නීත්‍යානුකූලව පරමාණුක බලශක්ති මණ්ඩලය වෙත පවරා නොමැති වීම හා එම ගොඩනැගිල්ල මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මණ්ඩලය වෙත නීත්‍යානුකූලව පවරා නොමැති වීම මත මෙම ගොඩනැගිල්ල අගය කිරීමට නොහැකිව ඇත. පැවරීමේ ක්‍රියාවලිය ඉක්මන් කර ගැනීම සඳහා රේඛීය අමාත්‍යාංශයේ ලේකම්තුමියගේ උපදෙස් මත අතිරේක ලේකම්වරයෙකු පත් කොට ඇත. ඒ හරහා අදාළ ආයතන සමඟ මේ සම්බන්ධව කටයුතු කරමින් පවතී. | ඉඩම්වල අයිතිය හා පිරිවැය සම්බන්ධ ගැටළු නිරාකරණය කර ගැනීමට කඩිනමින් පියවර ගත යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| "යම් ද්‍රව්‍යයක, වෙළඳ භාණ්ඩයක හෝ වස්තුවක විකිරණශීලි අපවිත්‍රතා සහ අයනීකාර විකිරණ මට්ටම් නිශ්චය කිරීම පිණිස පරීක්ෂණ සේවා ලබා දීම" ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ කාර්යයක් මෙන්ම බලතලයක් වේ. නමුත් 2019 වර්ෂය තුළ දේශීය වෙළඳපොළෙන් දේශීයව නිෂ්පාදනය කරන ලද කිරිපිටිවල විකිරණශීලි මට්ටම පරීක්ෂා කර තිබුණ ද දේශීය වෙළඳපොලෙන් ආනයනික කිරිපිටි සාම්පල් ලබා ගෙන පරීක්ෂා සිදු කර නොතිබුණි. | දේශීය වෙළඳපොලෙහි ඇති ආනයනික කිරිපිටි සාම්පල්, ළදරු කිරිපිටි ද ඇතුළත්ව විකිරණශීලිතාවය පරීක්ෂා කිරීම සඳහා වැඩපිළිවෙලක් ජෛව විද්‍යා අංශය මඟින් 2020 ජනවාරි මස සිට ආරම්භ කර ඇත. මෙම ක්‍රියාකාරකම අවුරුදු 03 ක කාලයක් සඳහා ශ්‍රී ලංකාව තුළ දිස්ත්‍රික් වැඩි ප්‍රමාණයක් ආවරණය වන පරිදි ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන අතර කිරිපිටි සන්නාම දේශීය වෙළඳපොලෙන් මිල දී ගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම ද ඇතුළත්ව වෙළඳපොල සමීක්ෂණ සඳහා සකස් කරන ලද සැලැස්ම 2020 ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ඇත. | මණ්ඩලයේ කාර්යය හා බලතලවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

### 3.3 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පරමාණුක බලශක්ති මණ්ඩලයේ 2019 වර්ෂය සඳහා රු. මිලියන 140 ක අයවැයගත ඇස්තමේන්තු ප්‍රාග්ධන ප්‍රතිපාදනවලින් සියයට 52.3 ක් එනම් රු. මිලියන 73.3 ක් වර්ෂය තුළ ඌන උපයෝජිතව පැවතුණි. එසේම පුනරාවර්තන වැය විෂයයන් 14 ක අයවැයගත ප්‍රතිපාදනය හා තත්‍ය වියදම අතර සියයට 30 සිට සියයට 254 ක් දක්වා වූ විචලනයක් නිරීක්ෂණය විය. තවද, සම්බන්ධීකරණ පර්යේෂණ ව්‍යාපෘති සඳහා 2019 දෙසැම්බර් 31 දිනට රු. 21,840,319 ක් අරමුදල් ලැබී තිබුණ ද 2019 වර්ෂය තුළ ඉන් රු. 1,717,145 ක් පමණක් වැයකර තිබුණි. ඒ අනුව එම ව්‍යාපෘතිවල මූල්‍ය කාර්යසාධනය සියයට 7.86 ක පමණ අඩු මට්ටමක පැවති බව නිරීක්ෂණය විය. | ප්‍රසම්පාදන සැලැස්මට අනුව ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට සැලසුම්කර තිබුණ ද, ප්‍රාග්ධන මුදල් වියදම් කිරීම සම්බන්ධයෙන් රජයෙන් නිකුත් වූ චක්‍රලේඛ වරින් වර වෙනස් වූ නිසා ඇතැම් ප්‍රසම්පාදන කටයුතු ඉටු කිරීමට නොහැකි විය. | අරමුදල් සැලසුම් කිරීම සහ උපයෝජනය කිරීම කාර්යක්ෂම අයුරින් සිදු කළ යුතුය. |

## 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) Isotope Ratio Mass Spectrometer නමැති උපකරණය 2015 දෙසැම්බර් 02 දින රු. 9,184,390 ක මුදලක් ගෙවා මිලදී ගෙන තිබූ අතර එම උපකරණය ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය වෙත ලැබී තිබුණේ 2018 අගෝස්තු 09 දිනය. මෙම උපකරණයේ ස්ථාපන කටයුතු වෙනුවෙන් 2019 වර්ෂය තුළ රු. 3,963,384 ක වියදමක් දරා 2019 මැයි මාසයේ ස්ථාපන කටයුතු අවසන් කර තිබුණ ද 2020 ජුනි 30 දින වන විට ද බාහිර පාර්ශවයන් වෙනුවෙන් සේවා සැපයීම් කිසිවක් සිදු කර නොතිබුණි. | උපකරණයේ මතු වූ දෝෂ සහගත තත්ත්වයන් මෙන්ම එය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය හීලියම් වායුව වෙළඳපොලෙන් මිල දී ගැනීමට නොමැති වීම මත මෙම උපකරණය අක්‍රියව පැවතුණි. | මුදල් රෙගුලාසි 780 ප්‍රකාරව රජයේ වැඩ හා සේවාවන් ඉටු කිරීමේ දී අරපිරිමැස්මෙන් හා කාර්යක්ෂමතාවයෙන් යුතු ව ඉටු කළ යුතු ය. |
| (ආ)2018 අප්‍රේල් 24 දින දක්වා පරමාණුක බලශක්ති මණ්ඩලයේ පැරණි ගොඩනැගිල්ලේ ස්ථාපිත කර තිබූ පිරිවැය රු. 5,598,851 ක් වූ Spetrophoto Meter Accessories උපකරණය නව ගොඩනැගිල්ල තුළ මෙතෙක් ස්ථාපිත කර නොමැති වීම නිසා නිෂ්කාර්ය වත්කමක් වශයෙන් පැවතුණි. | මෙම උපකරණය අප ආයතනයේ ඉන්වෙන්ට්‍රිගත කර ඇති බැවින් ක්ෂය ප්‍රතිපාදනය කරනු ලැබේ. | මුදල් රෙගුලාසි 780 ප්‍රකාරව රජයේ වැඩ හා සේවාවන් ඉටු කිරීමේ දී අරපිරිමැස්මෙන් හා කාර්යක්ෂමතාවයෙන් යුතු ව ඉටු කළ යුතු ය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඵලදායි සේවා මට්ටමක් පවත්වා ගැනීමට හා සේවක සංඛ්‍යාව පිළිබඳ කාලීන සමාලෝචනයක් කිරීමට නොහැකි වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ජ්‍යෝෂ්ඨ මාණ්ඩලික ශ්‍රේණිවල පුරප්පාඩු 15 ක් ද, තෘතීය මට්ටමේ පුරප්පාඩු 03 ක් ද, ද්විතීය මට්ටමේ පුරප්පාඩු 09 ක් ද, ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 03 ක් ද ඇතුළුව මණ්ඩලයේ පුරප්පාඩු 30 ක් පැවතුණි. ගැමා මධ්‍යස්ථානයේ අනුමත සේවක සංඛ්‍යාව 38 කින්, තනතුරු 04 ක සේවක පුරප්පාඩු 06 ක් නිරීක්ෂණය වූ අතර, තත්‍ය සේවක සංඛ්‍යාව වූ 32 කින් තනතුරු 04 කට අදාළව සේවකයින් 07 ක් පරමාණුක බලශක්ති මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයේ සේවයේ යොදවා තිබුණි. | පසුගිය වසරේ මැතිවරණයක් ප්‍රකාශයට පත්කර තිබීම, බඳවා ගත් පුද්ගලයින් සේවයෙන් ඉවත් වීම, බඳවා ගැනීමේ පටිපාටිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබෙන තෙක් බඳවා ගැනීම් ප්‍රමාද කිරීම වැනි හේතු මත මෙම පුරප්පාඩු පිරවීම ප්‍රමාද විය. මෙම පුරප්පාඩු ඉදිරියේ දී පුරවාලනු ඇත. සේවා අවශ්‍යතාවය මත ආයතනයෙහි ඇතැම් තනතුරු ප්‍රධාන කාර්යාලය මඟින් එහි අනුයුක්ත කර ඇත. | සේවක සංඛ්‍යාව පිළිබඳ කාලීන සමාලෝචනයක් සිදු කොට ඒ අනුව අදාළ පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු අතර ආයතනයේ විවිධ අංශවල කාර්යසාධනයට හාධාවක් නොවන ආකාරයයෙන් මානව සම්පත කළමනාකරණය කළ යුතු වේ. |